සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම - 2021
ஆண்டு இறுதி மதிப்பீடு

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂය / பாடம் / Subject: නැටුම් (දේශීය ) | පත්‍රය / வினாத்தாள் / Paper: I II | කාලය / மணித்தியாலம் / Hours: 03 |

i. සියලුම සිසුන් I වන කොටසේ මුල් ප්‍රශ්න 30ට අනිවාර්යයෙන්ම පිළිතුරු සැපයිය යුතුයි. ඊට අමතරව II උඩරට නර්තනය III පහතරට නර්තනය IV සබරගමු නර්තනය යන කොටස් තුනෙන් එක් කොටසකට පමණක් අංක 31 සිට 40 දක්වා පිළිතුරු සැපයිය යුතුය.

ii. II, III හා IV වන කොටස්වලින් අංක 31 සිට 40 දක්වා කලවමේ ප්‍රශ්න තෝරා නොගත යුතුයි. ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසට දැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලියා දැක්විය යුතුයි.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( X ) යොදන්න.

✱ සැලකිය යුතුයි.

i. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ii. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

---

## I කොටස

✱ අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචනය තෝරන්න.

01. ගොඩ සරඹ, දොඹින පද, ඉලංගම් සරඹ අභ්‍යාස කරනු ලබන නර්තන සම්ප්‍රදායන් පිළිවෙලින් .............................. වේ.

1. උඩරට, පහතරට, සබරගමු　　2. පහතරට,උඩරට,සබරගමු

3. උඩරට, සබරගමු, පහතරට　　4. සබරගමු, පහතරට, උඩරට

02. පතල්, ධීවර, කොහු යන කර්මාන්ත ආශ්‍රිතව ....................................ක්‍රියාකාරකම් දැකිය හැක.
1. ලුණු ඇඹරීම, ඉල්ලම් ගැරීම, දැල් එලීම
2. ඉල්ලම් ගැරීම, දැල් එලීම, ලුණු ඇඹරීම
3. ගස් කප්පාදු කිරීම, පැල නෙලීම, ඉල්ලම් ගැරීම
4. දැල් එලීම, ලුණු ඇඹරීම, ඉල්ලම් ගැරීම

03. “ උන් තැන අටයි තරිකිට දොද් දොං තා ........ ” මෙම පද කොටස .................................... වලට අයත් වේ.
1. ටිකා සිපද　　2. රබන් පද
3 රබන් කවි　　4. ඔංචිලි වාරම් කවි

04. ඇදහිය නොහැකි හා නුහුරු නුපුරුදු අත්දැකීම්වලට මුහුණ දීම වැනි විභාවයන්ගෙන් ................................රසය උපදී.

1 හාස්‍ය 2. අද්භූත

3 වීර 4. භයානක

05. ආහාර්ය අභිනයේ ප්‍රධාන අංශ ...................... කි

1. 5 2. 3

3 4 4. 2

06. අතීතයේ සිටම බෞද්ධ ආගමික වත්පිළිවෙත් වලදී සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් .......................... වාදනය යොදා ගනී.

1. සමූහ 2. රබන් පද

3 තම්මැට්ටම් 4. හේවිසි

07. මාත්‍රා 2 + 2 + 3 ............................. තුන්තිත නමින් හඳුන්වයි

1. දෙසුළු මැදුම් 2. දෙසුළු මහ

3 දෙමැදුම් මහ 4. දෙසුළු මැදුම් මහ

08. පුරාවෘත්ත කථා අනුව ......................... හා ............................... ශාන්තිකර්මයන්හි සමානකමක් දක්නට ඇත.

1. පහන්මඩු, කොහොඹාකංකාරිය 2. දෙවොල් මඩු, රටයකුම

3 පහන්මඩුව, කොහොඹාකංකාරිය 4. දෙවොල්මඩුව, පහන්මඩුව

09. කරදිය මුද්‍රා නාට්‍යය ........................................... මහතාගේ නිර්මාණයකි

1. එස්. පණිභාරත 2. චිත්‍රසේන ඩයස්

3 ප්‍රේමකුමාර එපිටවෙල 4. එදිරිවීර සරත්චන්ද්‍ර

10. ගම්පොල යුගයේ ලංකාවට පැමිණි දේශාටන වර්තාකරුවෙකු ලෙස ................................ හැඳින් වේ.

1. ස්පිල් බර්ජන් 2. රොබට් නොක්ස්

3 ඉබන් බතූතා 4. රබීන්ද්‍රනාත් තාගෝර්

ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා පහත සඳහන් වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| පේලිය | A තීරුව | B තීරුව | C තීරුව | D තීරුව |
|---|---|---|---|---|
| 1 | වජිරා චිත්‍රසේන | මිරැන්ඩා හේමලතා | බිසෝකප සිටුවීම | ථූප වංශ |
| 2 | සොත්තානා | පරයා | මහා වංශය | වෙදරාල |
| 3 | චූල වංශය | පත්තිනි නැටුම | දීප වංශය | මීරියම්ද සේරම් |
| 4 | කප් සිටුවීම | මඩු පේ කිරීම | ගුරුහාමි | චන්ද්‍රලේඛා පෙරේරා |

11 " ඉතින් කියන්නේ තුන්වෙනි වරට නටන්නේ ...." කවියෙන් නිරූපනය වන චරිතය දක්නට ලැබෙන්නේ,

1. 2 - පේළියේ B තීරුවේය
2. 4 - පේළියේ C තීරුවේ ය
3 2 පේළියේ D තීරුවේය
4. 2 - පේළියේ A තීරුවේය

12 1985 දි සොන්වා ජාත්‍යන්තර සම්මානයෙන් පිදුම් ලැබූ ප්‍රවීණ නර්තන ශිල්පිනිය දැක්වෙන්නේ,

1. 1 පේළියේ A තීරුවේය
2. 4 - පේළියේ D තීරුවේය
3 3 - පේළියේ D තීරුවේය
4. 4 - පේළියේ B තීරුවේය

13 ඓතිහාසික තොරතුරු වලට අනුව මහා පරාක්‍රමබාහු රජු නගර නිර්මාණයේදි නාට්‍ය ශාලා පහක් කරවූ බව දැක්වෙන වංශ කතාව ඇතුළත් වනුයේ,

1. 2 - පේළියේ C තීරුවේය
2. 1 - පේළියේ D තීරුවේය
3 3 - පේළියේ A තීරුවේය
4. 3 - පේළියේ C තීරුවේය

14 ශාන්තිකර්ම වලදී සම්ප්‍රදායන් තුනෙහිම එකම අරමුණකින් සිදු කෙරෙන චාරිත්‍ර විධි ඇතුළත් වනුයේ,

1. 4 - පේළියේ A හා B තීරුවලය
2. 3 - පේළියේ B තීරුවේය
3. 1 - පේළියේ C තීරුවේය
4. 4 - පේළියේ B තීරුවේය

15 ගිනි හොරා, හපනා මුද්‍රා නාට්‍ය නිර්මාණය කළ ප්‍රවීණ නර්තන ශිල්පීන් දක්නට ලැබෙන්නේ

1. 1 - පේළියේ B තීරුවේය
2. 1 - පේළියේ A තීරුවේය
3 3 - පේළියේ D තීරුවේය
4. 4 - පේළියේ D තීරුවේය

* නිවැරදි පිළිතුර තෝරන්න

16 " හනික වරෙව කොල්ලනේ මෙන්න මෙහෙ වරෙව්" ..... ගීතය ඇතුලත් නාට්‍ය වනුයේ

1. කුඹී කතාව ය
2. විදුර ය
3 බෙර හඬය
4. නරි බැනා ය

17 අංග රචනා විධික්‍රමයන්ට අනුව බාහිර ස්වරූපය වෙනස්කර චරිතයට අවශ්‍ය පරිදි සිදු කරන අංග රචනා ක්‍රමය නම්,

1. විකාර රූපී ය    2. චරිතාංග ය

3 ස්වභාවික ය    4. ශෛලිගත ය

18 බුදු ගුණ හා තුන් සරණේ කවි ඇතුළත් අසාතාත්මක හා අනාසාතාත්මකව ගැයෙන ගායනා විශේෂය කි.

1. නමස්කාර    2. ටීකා සීප ද

3 ඕංචිලි වාරම    4. ප්‍රශස්ති

✸ ප්‍රශ්න අංක 19 – 20 සඳහා රූප සටහන ඇසුරෙන් පිළිතුරු සපයන්න.

19 රූප සටහනෙන් දැක්වෙන්නේ



1. මහා කවි වල්ලතෝල් නාරායන මෙනන් ය
2. රොබට් නොක්ස් ය
3. මහා කවි රබීන්ද්‍රනාත් තාගෝර් ය.
4. ස්පිල් බර්ජන් ය.

20 මෙතුමන් ශ්‍රී ලංකාවට පැමිණි වර්ෂය නම්,

1. 1934    2. 1936

2 1940    4. 1930

21 හේවිසි වාදනයේදී යොදා ගන්නා විතත වාද්‍ය භාණ්ඩය

1. දවුල ය.    2. දඬු බෙරය ය.

3 හොරණෑව ය.    4. තම්මැට්ටම ය

22 " රටකට මව් සමඟින් එ නැව් නැග යන කළ අපෙ මුණිඳුන් ..............." යන කවි පාදය ඇතුලත් ගායනා විශේෂය,

1. නමස්කාරය.    2. කඩතුරා ය.

3 ඕංචිලිවාරම් ය.    4. රබන් ය.

23 සාම්ප්‍රදායික බෙර වාදන රංග වස්ත්‍රාභරණ කට්ටලයේ බහුලව දක්නට ලැබෙන ප්‍රධාන වර්ණ 2 කි

1. රතු, සුදු    2. සුදු , කහ

4 රතු, කළු    4. රතු, කහ

24 " ආංගිකම් භුවනම් යශ්‍ය............. " ශිව නමස්කාරය ඇතුළත් ග්‍රන්ථය,

1. භගවත් ගීතිකාවය.    2. නාට්‍ය ශාස්ත්‍රය ය.

5 අභිනය දර්පනය.    4. එදා හෙළදිවය.

25 පත්තිනි දෙවියන් හා සම්බන්ධ පූජාර්ථය අරමුණු කරගත් ගැමි නාටකයකි.

1. කෝලම්
2. නාඩගම්
3 රිද්දි යාගය
4. සොකරි

ප්‍රශ්න අංක 26 සිට 28 දක්වා පහත රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.



A



B

26 A රූප සටහනෙන් දැක්වෙන විදේශීය නර්තන සම්ප්‍රදාය නම්,

1. උත්තර භාරතීය කථක් ය.
2. දක්ෂිණ භාරතීය කතකලි ය.
3 දක්ෂිණ භාරතීය භරතය.
4. දක්ෂිණ භාරතීය කථක්ය.

27 B රූපසටහනේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය උගන්වන ආයතනය

1. අඩියාර්හි කලා ක්ෂේත්‍රම්ය
2. කේරළ කලා මණ්ඩලම් ය.
3 දිල්ලි කේන්ද්‍රය ය.
4. ශාන්ති නිකේතනය ය.

28 B රූපසටහන අයත් නර්තන සම්ප්‍රදායේ ප්‍රවර්ධනයට දායක වූවෙකි

1. මීනාක්ෂි සුන්දරම් පිල්ලෙ
2. තාන්ජුවර් සහෝදරයන්
3 නවාබ් වජ්ඩ් අලිෂා
4. වල්ලතෝල් නාරායන මෙනන්

29 ගීත අනුව නර්තන නිර්මාණය කිරීමේදී සැලකිය යුතු සුවිශේෂී කරුණකි

1. සාම්ප්‍රදායික නර්තන පමණක් යොදා ගැනීම
2. ගීතයේ තාලය, රිද්මය, ලය, අර්ථය පිළිබඳව මනා අවබෝධයෙන් නිර්මාණය කිරීම
3. දිසා හා තල පමණක් භාවිතා කිරීම
4. ගීතය එක වරක් ශ්‍රවණය කර නිර්මාණයේ යෙදීම

30 අධ්‍යාපනික අරමුණු වලට අනුව නර්තනය වූ කලී,

1. සරඹ පද්ධතියක එකතුවකි.
2. ප්‍රාසාංගික කලා මාධ්‍යයකි.
3. ගීත අනුව නර්තන ඉදිරිපත් කිරීමකි.
4. ශාස්ත්‍රීය පදනමක් මත ගොඩ නැගුණු මනෝචාලක ක්‍රියාවලියකි.

## II කොටස (උඩරට නර්තනය)

31 සම්ප්‍රදායික උඩරට නර්තනය ප්‍රචලිත ප්‍රදේශ වේ
1. සත්කෝරළය, සතර කෝරළය, පස්දුන් කෝරළය
2. සත් කෝරළය, සතර කෝරළය, මහනුවර
3. සතර කෝරළය, සල්පිටි කෝරළය, තුන් කෝරළය
4. සතර කෝරළය, රත්නපුර,සත්කෝරළය

32 උඩරට වෙස් ඇඳුම් කට්ටලයකට අයත් ආභරණ කීපයකි

1. හැඩ කැල්ල, පායිම්පත	2. ගෙජ්ජි,තෙල්කච්චිය
6 අවුල් හැරය, සිකා බන්ධනය	4. මෙකමෙන්ත, තෙල්කච්චිය

33 දොං දොං ජිං ........................................... බෙර පදයේ ඉතිරි කොටස

1. ජිං ගජිගත වේ	2. ගත ගොගොතක වේ
3 තත් කුද කුද වේ	4. කුද ගත දොං වේ

34 දහවන ගොඩ සරඹ නාමය වනුයේ

1. ඇල සරඹයයි.	2. පැනීමේ සරඹයයි.
3 දෑල සරඹයයි.	4. බඹර සරඹයයි.

35 "ගසමින් කගපතින් දෙපළව අසුර ගෙත් ''මෙම කවි පදය අයත් වන වන්නම වේ

1. සිංහරාජ	2. මුසලඩි
3 සැවුලා	4. වෛරොඩි

36 ගැට බෙරයෙන් වාදනය වන සතර බීජාක්ෂර වේ

1. තත් ජිත් තොං නං	2. තත් දිත් දොං නං
3 තත් දිත් තොං නං	4. තකට කුදට තකට කුදට

37 උඩරට නර්තන සම්ප්‍රදායට අමහත් සේවයක් කළ ප්‍රවීණ නර්තන ශිල්පියෙකි,

1. ජේ.ඇස්. ප්‍රනාන්දු මහතා.	2. රද්දැල්ලේ පොඩි මහත්තයා මහතා.
3 සචිරිස් සිල්වා මහතා.	4. ඇස් .පණිභාරත මහතා.

38 මාත්‍රා 3 + 4 දෙකිතට අයත් කස්තිරම කොටස වනුයේ

1. රුදගෙජින්නක තකට කුංදත් .......	2. තත්ත තරි තරි ............
3 තත් තකට තක රොං .........	4. රුංතක ජිංතක තරිකිට කුංදත් .......

39 වැදියකුන්, රුප්පායකුන් පුද ලබන්නේ ,

1. දෙවොල් මඩු ශාන්ති කර්මයේ ය. 2. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ ය.

3 පහන් මඩු ශාන්ති කර්මයේ ය. 4. කිරිමඩු ශාන්ති කර්මයේ ය.

40 කයිපුඩි වළල්ල, බෙරපුහුල යන කොටස් දැක්වෙන වාද්‍ය භාණ්ඩය වන්නේ

1. ගැටබෙරයයි. 2. දෙවොල් බෙරයයි.

3 දවුලයි. 4. උඩැක්කියයි.

## III කොටස (පහතරට නර්තනය)

31 සම්ප්‍රදායික පහතරට නර්තනය ප්‍රචලිත ප්‍රදේශ වේ.

1. මාතර, බෙන්තර, රත්නපුර 2. රයිගම, මාතර, බෙන්තර

3 මාතර, බෙන්තර, බලංගොඩ 4. රයිගම, බදුල්ල, කුරුණෑගල

32 පහතරට තෙල්මෙ ඇඳුමට අයත් ආභරණ කීපයකි.

1. පබළු හැට්ටය, කාහුල් 2. පබළු හැට්ටය, සේලය

3 පබළුහැට්ටය, තෙල් කච්චිය 4. පබළු හැට්ටය, අවුල් හැරය

33 තක දිත් තක දොං ................බෙර පදයේ ඉතිරි කොටස වේ.

1. දොං දිං ගත දොං 2. ගුං ගුද ගුං දිත්

3 ගුගුද ගදික ගත 4. දෙගත් ගත දොං

34 "ගුහිති ගදිරි කිට ගුද ගුද ගුම් දිත් තා" ................ මෙම ඉලංගම් සරඹය

1. 8 වන ඉලංගම් සරඹයයි. 2. 11 වන ඉලංගම් සරඹයයි.

3 6 වන ඉලංගම් සරඹයයි. 4. 10 වන ඉලංගම් සරඹයයි.

35 සඳ සන්දර දිගු පුන්ගිර ...................... මෙම කවි පාදය අයත් සිංදු වන්නම වේ

1. අනුරාගදණ්ඩ තාලය සිංදුවන්නම 2. හනුමන්තා තාලය සිංදු වන්නම

3 නාතිලිංචි තාලය සිංදු වන්නම 4. ශුද්ධතාලය සිංදු වන්නම

36 පහතරට බෙරයෙන් උපදින බීජාක්ෂර වේ.

1. තත් දිත් තොං නං 2. තත් දොං ජිත් නං

3 තත් දිත් ගත් තකු 4. තත් දිත් ගත් දොං

37 පහතරට නර්තන සම්ප්‍රදායට ඉමහත් සේවයක් කළ ප්‍රවීණ ශිල්පියෙකි

1. එස්. පණිභාරත මහතා 2. චිත්‍රසේන මහතා

3 රද්දැල්ලේ පොඩි මහත්තයා මහතා 4. කේ.ඇස්. ප්‍රනාන්දු මහතා

38 මාත්‍රා 2 + 4 දෙතිතට අයත් ඉරට්ටි කොටසක් වනුයේ,

1. දොම් තත් දිම් ගත ගුගුදිත ....
2. තකදින් තක දොම් කිත්තත්.....
3 ගුනිති ගදිරිකිට ගුද ගුද.....
4. දොමිතක තදිකින තරිකිට......

39 දෙවොල්, පත්තිනි, සපිරිවාර දෙවිවරුන් පුද ලබන්නේ.

1. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේය.
2. දෙවොල් මඩු ශාන්ති කර්මයේය.
3 පහන්මඩු ශාන්ති කර්මයේය.
4. කිරිමඩු ශාන්තිකර්මයේය.

40 හයි තට්ටුව, කැපුම් හම යන කොටස් ඇත්තේ

1. දෙවොල් බෙරයේය
2. දවුලෙහිය
3 ගැටබෙරයේය
4. උඩැක්කියේය

IV කොටස (සබරගමු)

31. සම්ප්‍රදායික සබරගමු නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ වේ.

1. රත්නපුර, කුරුවිට, අම්බලන්ගොඩ
2. රත්නපුර, පැල්මඩුල්ල, බලංගොඩ
3 කලවාන, මීරිගම, හාරිස්පත්තුව
4. රත්නපුර, සීනිගම, පානදුර

32. සබරගමු පබළු ඇඳුම් කට්ටලයට අයත් ආභරණ වේ.

1. රතුරෙද්ද, ජටා පටිය
2. අවුල්හැරය, බන්දි වළලු
3 පබළු හැට්ටය, නෙත්ති මාලය
4. අවුල් හැරය, නෙත්තිමාලය

33. කුදක් තක්කිට....................බෙර පදයේ ඉතිරි කොටස වේ.

1. තකට ජිමිතකු
2. ජිමිත්කුදකිට
3 ගත්ත ජිමිත්තත්
4. ගතික කුද කුද

34. කිත්තා කිත්තා ජෙජ් ජෙං තා.................මෙය,

1. 6 වන දොමින පදයයි
2. 8 වන දොමින පදයයි
3 9 වන දොමින පදයයි
4. 10 වන දොමින පදයයි

35. " අහස් කුසේ මැසි ගුවනින් එනවිට" .............................. මෙම කවිපදය අයිති වන්නේ

1. විරාඩි වන්නම
2. ගාහක වන්නම
3 මණ්ඩූක වන්නම
4. කොවුලා වන්නම

36. සබරගමු දවුලෙන් උපදින බීජාක්ෂර වේ.

1. තත් ජිත් තොං නං
2. තත් දොං ජිත් නං
3 තත් දිත් දොං නං
4. තත් තකට ජිත් ජිමිත

37. සබරගමු නර්තන සම්ප්‍රදායේ උන්නතියට ඉමහත් සේවයක් කළ ප්‍රවීණ ශිල්පියෙකි

1. එස්. පණිභාරත මහතා
2. චිත්‍රසේන මහතා
3. කේ.ඇස්. ප්‍රනාන්දු මහතා
4. රද්දැල්ලේ පොඩි මහත්තයා මහතා

38. මාත්‍රා 3 + 4 දෙතිතට අයත් අඩව් කොටසක් වනුයේ ....................

1. ජිංතගත්තත් ගතිත ගත දොං
2. ජිංත ගත ගත ගුදිත ගුද ගුද........
3. ගත්ත කුදිත්තා - දොංකට තරිකිට
4. කුදිත ගදිත කුද

39. දෙවොල් දෙවි, පත්තිනි දෙවි පුද ලබන්නේ,

1. කොහොඹා කංකාරිය.
2. පහන් මඩු ශාන්ති කර්මයේය.
3. කිරි මඩු ශාන්ති කර්මයේය.
4. සොකරි නාටකයේය.

40. ඉල්ලම්, වරමුදු යන කොටස් ඇත්තේ,

1. දවුලෙහිය.
2. දෙවොල් බෙරයේය.
3. ගැට බෙරයේය.
4. උඩැක්කියේය.

10 ශ්‍රේණිය

II පත්‍රය

පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01)

01. ඇඳුම් පැළඳුම්, වේශ නිරූපන ආදියෙන් අදහස් ප්‍රකාශ කිරීම................................ අභිනයවේ.

02. සන්නිවේදන කාර්ය සඳහා අතීතයේ සිට භාවිතා කළ විතතාතත භාණ්ඩයක් ලෙස .....................
හැඳින්විය හැකිය.

03. සිරසේ සිට පාදාන්තය දක්වා දොස් දුරුකිරීමට ........................... කවි ගායනා කරනු ලැබේ.

04. 'කමත' රඟමඩල ලෙස යොදා ගැනෙන්නේ....................................... ගැමි නාටකයේය

05. පහතරට නර්තන සම්ප්‍රදායේ ඉරට්ටිය වෙනුවට උඩරට නර්තන සම්ප්‍රදායේ නටනු ලබන්නේ............................. යි.

06. වාචික අභිනයෙන් තොරව චලන මාධ්‍යයෙන් කිසියම් තේමාවක් පදනම් කොට.............................. නාට්‍ය නිර්මාණය කර ඇත.

07. නවාබ් වජිද් අලිෂා රජු දායකත්වය දැක්වූ උත්තර භාරතීය නර්තන සම්ප්‍රදායකි ..............................

08. රාජ සභා ආශ්‍රිතව පවත් සැලීම සංකේතවත් කරමින් බිහි වූ ගැමි නැටුමක් ලෙස .........................
නැටුම හැඳින්විය හැක

09. පහත සඳහන් නර්තන අංග දක්නට ලැබෙන නර්තන සම්ප්‍රදායන් නම් කරන්න.
තෙල්මෙ ............................................ යක්කැන්නුම........................................

10. සොකරි ගැමි නාටකයේ ප්‍රාදේශීය වශයෙන් යොදාගනු ලබන වාද්‍ය භාණ්ඩ මෙසේ දැක්විය හැකිය. වන්නි ප්‍රදේශය.............................................
ඌව ප්‍රදේශය ............................................

(1x12 = 12)

(02) i මාත්‍රා 3 + 3 තනි තිතට අයත් බෙරපදයක් / අඩුල් පදයක් ප්‍රස්ථාර කරන්න.

ii මාත්‍රා 4 + 4 තනිතිතට අයත් කවි පද දෙකක් ප්‍රස්තාර කරන්න.

iii. මාත්‍රා 2 + 3 දෙතිතට අයත් අඩව්වක් / ඉරට්ටියක් /කලාසමක් ප්‍රස්තාර කරන්න

(03) පහත සඳහන් මාතෘකා අතුරින් තුනක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

i වන්නම්

ii සතර අභිනය

iii රබන් කවි

iv. චයිරා චිත්‍රසේන මිය.

V. දේශීය නාට්‍ය වර්ග

(4 X 3 = 12)

(04). i ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් ශාන්තිකර්මය නම් කර එයට අයත් චාරිත්‍ර විධි තුනක් ලියන්න

ii. ශාන්ති කර්මයන්හි දැකිය හැකි ආසාතාත්මක හා අනාසාතාත්මක ගායනා දෙක බැගින් නම් කරන්න.

iii. ශාන්ති කර්මයන්හි පුරාවෘත කතාවලින් අප සමාජයට ගත හැකි ආදර්ශයන් කවරේදැයි විස්තර කරන්න. (3+4+5=12)

(05).



i. මෙම රූප රාමුවෙන් දැක්වෙන ගැමි නාටකය නම්කර එහි දැක්වෙන චරිත දෙක නම් කරන්න.

ii. එම චරිතයකට අදාල කවියක් ලියන්න.

iii. මෙම නාටකයේ රංග වස්ත්‍රාභරණ යොදාගෙන ඇති ආකාරය චරිත දෙකක් ඇසුරින් විස්තර කරන්න.

(4X3=12)

(06)

i. '' මුද්‍රා නාට්‍ය'' යන්න කෙටියෙන්හඳුන්වන්න.

ii. මුද්‍රා නාට්‍ය නිර්මානය කරන ලදශිල්පීන් දෙදෙනෙක් නම් කර ඔවුන් විසින් නිර්මානය කරන ලද මුද්‍රා නාට්‍ය දෙකක් ලියන්න.

ii.ඔබ උගත් මුද්‍රා නාට්‍යයක පසුබිම්වූ කතා පුවත පිළිබඳ විස්තරයක් කරන්න. (4X3 =12)

(07)



i. රූපයේ දැක්වෙන වාද්‍ය භාණ්ඩය නම් කර එය අයත් භාරතීය නර්තන සම්ප්‍රදාය ලියන්න.

ii. එම නර්තන සම්ප්‍රදායට අයත් රංග වස්ත්‍රාභරණ කොටස් හතරක් පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.

III එම නර්තන සම්ප්‍රදායට පසුබිම් වූ දේව ඇදහිලි හා ගැමි නාටක පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

(4X3 = 12)

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

තෙවන වාර ඇගයීම - 2021

ශ්‍රේණිය - 10 විෂයය - නැටුම් (දේශීය) පත්‍රය - i , ii

පිළිතුරු පත්‍රය

I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1) 3 | 11) 1 | 21) 4 | 31) 2 |
| 2) 2 | 12) 4 | 22) 4 | 32) 3 |
| 3) 1 | 13) 3 | 23) 1 | 33) 1 |
| 4) 2 | 14) 4 | 24) 3 | 34) 4 |
| 5) 4 | 15) 2 | 25) 4 | 35) 3 |
| 6) 4 | 16) 3 | 26) 1 | 36) 1 |
| 7) 1 | 17) 2 | 27) 2 | 37) 4 |
| 8) 4 | 18) 3 | 28) 4 | 38) 1 |
| 9) 2 | 19) 3 | 29) 2 | 39) 2 |
| 10) 3 | 20) 1 | 30) 4 | 40) 1 |

1 X 40 = 40

II පත්‍රය

1. ආහාර ා අභිනය
2. දවුල
3. සිරසපාද
4. සොකරි
5. කස්තිරම
6. මුද්‍රා
7. කථක්
8. චාමර
9. තෙල්මෙ - පහතරට, යක්කැන්නුම - උඩරට
10. වන්නි - උඩැක්කිය, ඌව - දවුල